# මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
# සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය
# තනතුරු පුරප්පාඩු දැන්වීමයි

මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය යටතේ ස්ථාපිත සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලයේ පහත සඳහන් තනතුරු පුරප්පාඩු සඳහා සුදුසුකම් සහිත පළපුරුදු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | තනතුර | තනතුරු සංඛ්‍යාව | සුදුසුකම් |
|---|---|---|---|
| 01 | නියෝජ්‍ය සුබසාධන ප්‍රතිලාභ කොමසාරිස් (සංවර්ධන සහ මෙහෙයුම්) MM-1-3 | 01 | I. ආර්ථික, සංඛ්‍යාලේඛන, මුදල්, රාජ්‍ය පරිපාලනය, ව්‍යාපාර පරිපාලනය, සංවර්ධන අධ්‍යයනය හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්.<br>සහ<br>II. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද. |
| 02 | නියෝජ්‍ය සුබසාධන ප්‍රතිලාභ කොමසාරිස් (පද්ධති කළමනාකරණය) MM-1-3 | 01 | I. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධති, ජාල ඉංජිනේරු විද්‍යාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්.<br>සහ<br>II. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද. |
| 03 | නියෝජ්‍ය සුබසාධන ප්‍රතිලාභ කොමසාරිස් (සුපරීක්ෂණ සහ ඇගයීම) MM-1-3 | 01 | I. ආර්ථික විද්‍යාව, ව්‍යාපෘති කළමනාකරණය, ව්‍යාපාර පරිපාලනය, සංවර්ධන අධ්‍යයනය, දත්ත විද්‍යාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>II. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර හතරක (04) පළපුරුද්ද. |
| 04 | සහකාර සුබසාධක කොමසාරිස් (පාලන) MM-1-1 | 01 | I. මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය / ව්‍යාපාර පරිපාලනය පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>II. ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. |

| | | | |
|---|---|---|---|
| 05 | සහකාර සුබසාධන කොමසාරිස් (ගෙවීම් සහ සැසඳුම්) MM-1-1 | 01 | I. ගණකාධිකරණය, මූල්‍ය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br><br>II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය අදාළ වන පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අතරමැදි විභාගය සමත්වීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද සුදුසුකම් ලැබීම. |
| 06 | සහකාර සුබසාධන කොමසාරිස් (ව්‍යාපෘති මූල්‍ය කළමනාකරණය සහ වාර්තාකරණය)<br><br>MM-1-1 | 01 | I. ගණකාධිකරණය, මූල්‍ය, මූල්‍ය කළමනාකරණය, ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br><br>II. තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රය අදාළ වන පිළිගත් වෘත්තීය වරලත් ආයතනයක අතරමැදි විභාගය සමත්වීම සහ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක පළපුරුද්ද සුදුසුකම් ලැබීම. |
| 07 | සහකාර සුබසාධන කොමසාරිස් (තොරතුරු තාක්ෂණ පද්ධති සංවර්ධක) MM-1-1 | 01 | I. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, පරිගණක විද්‍යාව, මෘදුකාංග ඉංජිනේරු විද්‍යාව, තොරතුරු පද්ධති, දත්ත විද්‍යාව හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්.<br>සහ<br>පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද.<br><br>II. තෘතියික සහ වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම 7 ට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම<br>සහ<br>රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක්/ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසරක පළපුරුද්දක් තිබිය යුතුය. |
| 08 | සහකාර සුබසාධක කොමසාරිස් (දුක්ගැනවිලි කළමනාකරණය) MM-1-1 | 01 | I. සමාජ විද්‍යාව, සමාජ වැඩ, කළමනාකරණය, රාජ්‍ය පරිපාලනය / සබඳතා පිළිබඳ උපාධියක් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් තනතුරේ විෂය ක්ෂේත්‍රයට අදාළ වෙනත් උපාධියක්<br>සහ<br>II. පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්ද. |
| 09 | රියදුරු PL-3 | 02 | I. සාමාන්‍ය පෙළ විෂයන් හයක් (06) සමත් වීම. (සා.පෙළ) විභාගය, අවම වශයෙන් වාර දෙකක (02) සාමාන්‍ය සාමාර්ථ සහිතව උපරිම වාර දෙකක.<br>සහ<br>II. බර වාහන පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල්වරයා විසින් නිකුත් කරන ලද බලපත්‍රය ලබාගෙන තිබීම සහ රියදුරු බලපත්‍රය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් වසර තුනක (03) පළපුරුද්දක් තිබීම. |

**වයස :**

නියෝජ්‍ය සුබසාධන ප්‍රතිලාභ කොමසාරිස් - අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
සහකාර සුබසාධක කොමසාරිස් - අවුරුදු 22ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
රියදුරු - අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**
මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට කැඳවනු ලබන අතර ඉන් ලබාගන්නා ලකුණු වල ප්‍රමුඛතාවය අනුව බඳවා ගැනීමට කටයුතු කරනු ලැබේ.

**බඳවාගැනීමේ කොන්දේසි :**
මෙම තනතුරු ස්ථිරය. තනතුර ස්ථිර කිරීමට පෙර වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

**මාසික වැටුප :**

MM 1-3 - 2016 රු. [55,925 - 10 x 1,375 - 15 x 1,910 - 98,325] + රජයේ අනුමත වෙනත් දීමනා,
MM 1-1-2016 රු. [53,175 – 10 x 1,375 – 15 x 1,910 – 95,575] + රජයේ අනුමත වෙනත් දීමනා,
PL 3-2016 රු. [26,290 – 10 x 270 - 10 x 300 – 10 x 330 - 12 x 350 - 39,490] + රජයේ අනුමත වෙනත් දීමනා,
වැටුපෙන් 8% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් ගෙවිය යුතු අතර සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් 12%ක් රජයේ දායක මුදල් ලෙස ගෙවනු ඇත. තවද, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට 3% ක දායක මුදලක් සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය විසින් ගෙවනු ලැබේ.

ආදර්ශ අයදුම්පත්‍රය පහත වෙබ් අඩවි වලට පිවිසීමෙන් බාගත කර ගත හැකිය.
https://www.treasury.gov.lk/web/ministry-of-finance-vacancies/section/current%20vacancies
https://www.wbb.gov.lk/web/si/jobs

සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.07.03 දින හෝ එදිනට පෙර **කොමසාරිස්, සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය, ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානය, නො. 191, ධර්මපාල මාවත, කොළඹ 07** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් පමණක් එවිය යුතුය. රජයේ / සංස්ථා වල සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාළ ආයතනය වල ප්‍රධානීන් මාර්ගයෙන් යොමුකළ යුතුය. පමා වූ, අසම්පූර්ණ හෝ අයදුම්පත් කැඳවීමේ අවසාන දිනෙන් පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරේ.

තවද, අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර පැහැදිලිව සඳහන් කළ යුතුය. මෙම දැන්වීම අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ අයදුම්කරුවන් කෙටි ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්ගේ තීරණය අවසන් තීරණය සේ සැලකිය යුතුය.

**කොමසාරිස්**
**සුබසාධක ප්‍රතිලාභ මණ්ඩලය**
**මුදල්, ආර්ථික ස්ථායීකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය**